## ලියා දන්වන වග

**පෘථිවියේ වෙසෙන බොහෝමයක් සතුන් මෙන්ම මිනිසාද රාශි වශයෙන් වශයෙන් ජීවත් වේ. මින් සතුන්ට හා මිනිසාට පොදුවේ ආරක්ෂාව ආහාර සපයා ගැනීමේ පහසුව ලැබේ. මෙයට අමතරව විනෝදය ඇතුළු අනෙකුත් බොහොමයක් පහසුකම් මිනිසා ලබන්නේ රාශි ගත වීමෙ ප්‍රතිඵලයක් වශයෙනි .මීට නැතිවම බැරි සාධකය නම් අදහස් හුවමාරුවයි.අද මෙ සඳහා යහපත් හා විශිෂ්ඨ සාමූහික මෙවලම පුවත්පතයි.**

**ඔබ විසින් අප වෙත පිරිනමන දැනුම විනෝදය අදහස් උපදෙස් හා සංවේදීතාවයන් මනා ලෙස අප ජීවත් වන ඕස්ට්‍රේලියාව තුල මුද්‍රිත මාධ්‍යයක් ලෙසිනුත් ලංකාව ඇතුළු ලෝකයේ අනෙකුත් රටවල් වෙත අන්තර් ජාලය හරහාත් ලබා දීම අති සාර්ථක ලෙස අප පුවත්පත මගින් ඉටු කර ලන්නෙමු අපගේ සාර්ථකත්වය අපගේ පාඨකයා හා ලේඛකයා වන ඔබමය.**

**සංස්කරණය / Editors**
චිත්‍රාන් මොරකන්දෙ ගමගේ

අනුශාසක / **Advisor**
දෙනගම සිරිවර්ධන මහතා

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by Crystal D**
Digital Agency
www.crystald.com.au

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ
හර්ෂ කසුන්
ශනිල්ක නදීශාන්

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Dilki : 0426 959 540**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:**
Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.

# හතරවැනි තට්ටුව ජිනීවා යන හැටි

**සිංහල වැසියන් හා කාන්තාවන් මෙන්ම ළදරුවන් 100 ක් කපාකොටා මරාදැමීම මෙහෙයවූ කොටි හමුදා නායක සිද්දාට බ්‍රිතාන්‍යයේ දේශපාලන රැකවරණ**

**කීර්ති වර්ණකුල සූරිය**



- **මෙරට දේශපාලන කටයුතු ගැන සෙවීමට ඇමරිකන් කෝනර් නමින් කාර්යාලයක් මාතරදී ස්ථාපිත කෙරේ**
- **ගෝතමාලා වෝහාරික විශේෂඥයන් තිදෙනෙක් මන්නාරමේ**
- **උතුරේ හර්තාලයට කොටි ඩයස්පෝරාවේ අරමුදල්**
- **ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් 2 ක් සහ හමුදා නිලධාරීන් 2 ක් ඇතුළු 47 කට එරෙහිව යුද අපරාධ චෝදනා**
- **ශ්‍රී ලංකාවේ පොලිස් වධකාගාරයක් ගැන යස්මින් සූකා මානව හිමිකම් කවුන්සිලයට පැමිණිලි කරයි**

40 වැනි ජිනීවා මානව හිමිකම් සමුළුවේදී ශ්‍රී ලංකාවට එරෙහිව යුද අපරාධ මෙහෙයුම් රැසක් ඉදිරිපත් වන අවස්ථාවේ රජය මෙතෙක් ඊට ප්‍රතිචාර දැක්වීමට ඉදිරිපත් වී නැත. එහෙත් එක්සත් ජාතීන්ගේ හිටපු නිලධාරිනි යස්මින් සූකා සහ ලන්ඩන් නුවර ප්‍රීඩම් ප්‍රොම් ටෝචර්ස් නැමැති සංවිධාන මෙරට ආරක්ෂක හමුදාවට සහ පොලිසියට එරෙහිව විමර්ශන වාර්තා දෙකක් ප්‍රකාශයට පත්කරනු ලැබීය.

සූකා ඉදිරිපත් කළ වාර්තාවෙන් සුදු වෑන් සිදුවීම ගැන පරීක්ෂණ භාරව සිටි නියෝජ්‍යපොලිස්පති නන්දන මුණසිංහ සහ බුද්ධි සේවා ප්‍රධානි සිසිර මෙන්ඩිස්ටද වධ හිංසා පැමිණවීමේ චෝදනා එල්ල කර තිබිණි. ඊට අමතරව වධහිංසා පැමිණවීම ගැන හිටපු හමුදාපති ජගත් ජයසූරියට සහ හමුදා මාණ්ඩලික ප්‍රධානි ශවේන්ද්‍ර සිල්වාට ද චෝදනා නඟා ඇත.

මේ හැර ද්‍රවිඩයන්ට අමානුෂික වධහිංසා පමුණුවා ඇතැයි දක්වමින් ආරක්ෂක හමුදාවේ 47 කටද චෝදනා නැඟූ යස්මින් සූකා ඊට සම්බන්ධ නිලධාරියකු විදේශ රටක පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක සේවය කරන බවත් තවත් නිලධාරීන් දෙදෙනෙක් ඕස්ට්‍රේලියාවේ පදිංචිවී සිටින බවටත් අනාවරණය කර ඇත.
යස්මින් සූකා තම වාර්තාවේ තවදුරටත් දැක්වූයේ ද්‍රවිඩයන් 76 කට වධහිංසා පමුණුවා ඇති බවයි.

එහෙත් වධහිංසාවලට ලක්වූවන් කවුරුන්දැයි ඇය හෙළිකර නැත.

මේ හිටපු එක්සත් ජාතීන්ගේ නිලධාරිනියට සමානව ප්‍රීඩම් පශ්‍රාම් ටෝචර්ස් ආයතනය පැවසුවේ වධහිංසා පැමිණවීමේ මධ්‍යස්ථානය මෙහෙයවනු ලැබුවේ නියෝජ්‍යපොලිස්පති සිසිර මෙන්ඩිස් බවයි. සිසිර මෙන්ඩිස්ට එරෙහි චෝදනා එල්ල කරනු ලැබුවේ එක්සත්ජාතීන්ගේ කමිටු නිලධාරිනියක්වූ පෙලිනේ හැරීය.



මෙම පොලිස් නිලධාරියා ජිනීවාහි පැවැති එක්සත්ජාතීන්ගේ කමිටු රැස්වීමකට පැමිණි අවස්ථාවේ ඔහුව අත්අඩංගුවට ගැනීම සඳහා ජර්මනියේ ජේ ඍදු එස් සංවිධානය එක්සත් ජාතීන්ගේ සහ ස්විස් නඩු අධ්‍යක්ෂකවරයාගෙන් කළ ඉල්ලීම අසාර්ථක වූයේ සිසිර මෙන්ඩිස් තානාපති මුක්තිය තිබූ නිසාය. මේ පිළිබඳව එවකට විදේශ කටයුතු ඇමැතිව සිටි මංගල සමරවීර පැවසුවේ තමා කලින් දැනසිටියේ නම් ඉහත කී පොලිස් නිලධාරියාව ජිනීවා යවන්නේ නැති බවයි.

මේ තත්ත්වය මත 2015 සැප්තැම්බර් මස පැවැති ජිනීවා මානව හිමිකම් සමුළුවේදී ජිනීවා යෝජනාවට සම අනුග්‍රහය දැක්වීම